Art Page



# සඳ පහන් රැයක ගී ගයන ඉන්දිකා

ගායනයෙන්, රංගනයෙන්, නර්තනයෙන් හදවත් වශීකළ ඉන්දිකා උපමාලි ගේ ප්‍රථම සජීව සංගීත ප්‍රසංගය සහ කුළුදුල් සංයුක්ත තැටිය "සඳ පහන් රැයේ" නමින් පසුගියදා දොරට වැඩීම සිදුවිය. පාසැල් වියේ දී සිටම මාලනී බුලත්සිංහල මහත්මිය ගෙන් හා ප්‍රේමසිරි කේමදාස ගාන්ධර්වයාණන් වෙතින් සංගීතය, ගායනය ප්‍රගුණ කළ ඇයගේ මුල්ම ටෙලි නාට්‍ය රංගනය වූයේ, ජාතික රූපවාහිනියෙන් විකාශය වූ තුසිත ජයවර්ධනගේ "ධවල කේතු" ටෙලි නාට්‍යයි. ඉන් අනතුරුව ඇය කේමදාසයන් නිර්මාණය කළ සංධවනි කිහිපයකම ප්‍රධාන භූමිකාවක් නිරූපනය කළාය. ටෙලි නාට්‍ය 20 කට පමණ රංගනයෙන් දායක වී තිබේ. කේමදාස සිසු පරපුරේ දීප්තිමත් ශිෂ්‍යාවක වූවාය. .

පසුගියදා අවසන් වූ ශ්‍රී ලංකන් ලයිෆ් තරගාවලියේ විනිශ්චයමණ්ඩලයේ සාමාජිකාවක් ලෙසද , ඉන්දිකා උපමාලි විශිෂ්ට සේවයක් ඉටු කළාය. තරඟකාරී රැල්ලට හසු නොවී පුරා විසි වසරක් ඉවසීමෙන් හා නිරන්තරයෙන් ප්‍රගුණ කළ හඬ පිලිබඳ අභ්‍යාසයෙන් යුතුව හා රංගන කුසලතාවයෙන් යුතුව කලා ක්ෂේත්‍රයේ දඟු ගමණක් යන්නට ඇය පෙරුම්පුරා සිටින්නිය.

**දිනූ සම්මාන:-**

| | |
|---|---|
| **2003 - ජනාධිපති සම්මානය** | **- සුළං කිරිල්ලී චිත්‍රපටයේ ගායනය සඳහා** |
| **2004 - සිග්නිස් සම්මානය** | **- ආදරණීය වස්සානය චිත්‍රපටයේ ගායනය සඳහා** |
| **2007 - සුමති සම්මානය** | **- කෙළිමඩල චිත්‍රපටය - හොඳම ගායනය සඳහා** |
| **2008 - බුන්කා සම්මානය** | **- කලා ක්ෂේත්‍රයට කළ දායකත්වය වෙනුවෙන්** |

එදිනෙදා ජීවිතයට -

- ඔබගේ දෑත සෑම වේලාවකදීම දහඩියෙන් තෙත්වී ඇත්නම් විටින් විට පියර වර්ගයකින් දෑත පිරි මදින්න.
- උණු වතුරට ලුණු බිඳක් මිශ්‍ර කර එය නිවුණු පසු ඇස් දෙක හොඳහැටි එම වතුරෙන් සෝදන්න. ඇස් දෙකේ වෙහෙස ගතිය මඟහැරී දීප්තිමත් බවක් ගෙන දේ.
- පාන්දරින් දෙහි මිශ්‍ර වතුර වීදුරුවක් බොන්න. ශරීරයේ ලේ පිරිසිදු වේ. ඇඟට ප්‍රාණවත් ගතියක් දැනේ.
- ඔබේ ඇඳුම් වල දහඩිය පැල්ලම් ඇති වූ විට ඇඳුම ඇල් දියෙන් තෙමා වේලී යන විට එය ආයෙත් තෙමන්න. අනතුරුව ඇමෝනියා මිශ්‍ර කල වතුරෙහි පොඟවා පසුව සබන් ගා සෝදන්න.
- සුප් එකට ලුණු වැඩිවී නම් අමු අර්තාපල් පෙති කිහිපයක් දමන්න. වැඩි වූ ලුණු එයට උරාගනී පසුව ඒවා ඉවත් කරන්න.
- නිතර තෙතමනයෙන් යුත් මුළුතැන්ගෙයි රාක්ක ආදිය හුණු වලින් පිරවූ භාජනයක් සමීපයේ තැබීමෙන් වියලි යනවා ඇත. තෙතමනය හුණු වලට උරාගනී.
- ජෝජට් වැනි සිහින් රෙදි වර්ග කපන්නට පෙර කපුර උතුරන වතුරෙහි දමා ගන්න. එවිට ඇදනොවී පහසුවෙන් කපා ගතහැක.
- කුඩරෙද්ද කිලිටි වී ඇත්නම් කෙඳි සහිත බුරුසුවකින් පිසදමා මැතිලේටඩ් ස්ප්‍රීතු ස්වල්පයක් තැවරූ රෙදි කෑබැල්ලකින් හොඳින් පිසදමන්න.
- වර්ණවත් ෆැබ්රික් රෙදි වර්ග සෝදන විට ඒ වතුරට විනාකිරි ස්වල්පයක් මිශ්‍ර කරන්න. එවිට සායම් යෑම වලකී.
- රතුළුණු හෝ සුදුළුණු කෑ පසු ඔබේ මුවේ ඇතිවන දුගඳ දුරුකර ගැනීමට හකුරු කැල්ලක් හපන්න.
- පරිප්පු පිසීමට පෙර කබලේ ලා රත්කර ගැනීමෙන් රසය අධික වේ.

**ජේ.එම්.ෆොන්සේකා ලියයි**